# රැකියාවේ සේවා තත්වය අනුව සේවා නියුක්තිය පිළිබඳ අධ්‍යයනය






මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව

ආර්.එම්.ජේ.එච්.ගජනායක

(සංවර්ධන නිලධාරී)

## රැකියාවේ සේවා තත්වය අනුව සේවා නියුක්තිය

**හැඳින්වීම**

රටක ආර්ථිකය විග්‍රහ කිරීමේ දි එම රටේ ශ්‍රම බලකාය ඉතා වැදගත් නිර්ණායකයකි. ශ්‍රම බලකාය ලෙස හැඳින්වෙනුයේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනයයි. දැනට වයස අවු: 15ට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත යන කොටස් දෙකම මෙයට අයත් වේ.

ඒ අනුව මෙහි දී විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ සේවා නියුක්තිය පිළිබඳවයි. වැටුපකට හෝ වෙනත් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් දැනට ආර්ථික කටයුතුවල නියැලී සිටින පුද්ගලයන් සේවා නියුක්ත ජනගහනය ලෙස හැඳින් වේ. වැටුප් (රාජ්‍ය) හා පෞද්ගලික අංශයේ සේවකයින්), සේවා යෝජකයින් , ස්වයං රැකියාවල නියුක්ත වූවන් සහ ගෙවීමක් නොලද පවුලේ ශ්‍රමිකයින් මීට අයත් වේ.

සාමාන්‍යයෙන් රටක මුළු සේවා නියුක්ත ජන සංඛ්‍යාව ඒ රටෙහි ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම සේවා නියුක්ත අනුපාතය වේ. 2018 වර්ෂයේ සේවා නියුක්ති අනුපාතය 95.6 %ක් වේ. (ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව)

රටක ආර්ථිකය විග්‍රහ කිරීම සඳහා රැකියා නියුක්තිය පිළිබඳ ලබාදෙන දත්තයන් ඉතා සුවිශේෂි සමාජ දර්ශකයක් වනු ඇත. රැකියා නියුක්තිකයන් පිළිබඳ, රැකියාවේ සේවා තත්වයන්, ඔවුන්ගේ සුදුසුකම්, ස්ත්‍රී/ පුරුෂභාවය ආදිය පිළිබඳ සංඛ්‍යාලේඛන මෙහි දී වැදගත් වේ.

ඒ අනුව මෙම වාර්තාවට අන්තර්ගත වන්නේ රැකියාවේ සේවා තත්වය අනුව රැකියා නියුක්තිය පිළිබඳ වසර දෙකක දත්තයන් පිළිබඳ විමර්ශනයකි. එහි දී,

- රැකියාවේ සේවා තත්වය දිස්ත්‍රික් මට්ටමින්
- රැකියාවේ සේවා තත්වය ස්ත්‍රී/ පුරුෂභාවය අනුව
- රැකියාවේ සේවා තත්වයන් යටතේ රැකියා නියුක්තිය

යන කොටස් යටතේ දත්ත ඉදිරිපත් කරනු ලැබේ.

01. රැකියාවේ සේවා තත්වය අනුව රැකියා නියුක්තිය - 2016/ 2017

| රැකියාවේ ස්වභාවය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | එකතුව | % | එකතුව | % |
| මුළු එකතුව | 7947683 | 100 | 8208179 | 100 |
| සේවක | 4595577 | 57.8 | 4734031 | 57.7 |
| රාජ්‍ය | 1157658 | 14.6 | 1178708 | 14.4 |
| පෞද්ගලික | 3437919 | 43.3 | 3555323 | 43.3 |
| සේවා යෝජක | 217215 | 2.7 | 247470 | 3.0 |
| තමාගේම වැඩ කරන්නා | 2511750 | 31.6 | 2571023 | 31.3 |
| පවුලේ ආර්ථිකයට උදව් කරන්නා | 623141 | 7.8 | 655655 | 8.0 |

මුලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - වාර්ෂික වාර්තා




ඉහත දත්ත පිළිබඳ සලකා බැලූ විට පෞද්ගලික අංශයේ 2016 හා 2017 වර්ෂ ගත්හි ප්‍රතිශතයක් ලෙස ගත්විට වර්ධනයක් දක්නට නොලැබේ. සේවක සංඛ්‍යාව ගත්විට ද දක්නට ලැබෙන්නේ 2016 වර්ෂයට වඩා යම් අඩුවීමකි. රාජ්‍ය අංශයේ ද එය දක්නට ලැබේ.

02. රැකියාවේ සේවා තත්වය දිස්ත්‍රික් මට්ටමින් (%) - 2016/ 2017

| | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **දිස්ත්‍රික්කය** | සේවක | සේවා යෝජක | තමාගේම වැඩ කරන්නා | පවුලේ ආර්ථිකයට උදව් කරන්නා | සේවක | සේවා යෝජක | තමාගේම වැඩ කරන්නා | පවුලේ ආර්ථිකයට උදව් කරන්නා |
| **කොළඹ** | 69.3 | 4.9 | 22.5 | 3.3 | 65.4 | 6.5 | 23.7 | 4.4 |
| **ගම්පහ** | 68.6 | 3.1 | 25.1 | 3.2 | 66.8 | 4.1 | 25.0 | 4.1 |
| **කළුතර** | 63.1 | 3.0 | 29.2 | 4.7 | 69.0 | 1.6 | 25.1 | 4.4 |
| **මහනුවර** | 60.3 | 3.4 | 30.3 | 5.9 | 57.6 | 3.8 | 31.2 | 7.3 |
| **මාතලේ** | 43.1 | 2.4 | 38.5 | 16.1 | 45.8 | 2.4 | 35.7 | 16.2 |
| **නුවරඑළිය** | 61.6 | 0.2 | 27.3 | 10.9 | 60.8 | 1.1 | 26.0 | 12.2 |
| **ගාල්ල** | 61.3 | 2.6 | 29.6 | 6.5 | 63.0 | 2.9 | 27.6 | 6.5 |
| **මාතර** | 59.9 | 2.3 | 29.7 | 8.1 | 57.0 | 3.3 | 31.5 | 8.1 |
| **හම්බන්තොට** | 44.5 | 2.6 | 44.3 | 8.7 | 47.1 | 1.4 | 40.1 | 11.4 |
| **යාපනය** | 66.9 | 4.5 | 25.6 | 2.9 | 62.4 | 3.0 | 32.3 | 2.2 |
| **මන්නාරම** | 60.9 | 3.5 | 33.1 | 2.5 | 57.7 | 2.5 | 36.1 | 3.8 |
| **වව්නියාව** | 52.4 | 1.8 | 40.3 | 5.5 | 53.4 | 1.5 | 39.8 | 5.3 |
| **මුලතිව්** | 47.6 | 0.7 | 41.6 | 10.1 | 48.1 | 1.4 | 46.0 | 4.5 |
| **කිලිනොච්චි** | 65.0 | 1.4 | 32.4 | 1.1 | 62.4 | 2.6 | 34.2 | 0.8 |
| **මඩකළපුව** | 65.0 | 1.3 | 31.4 | 2.3 | 61.7 | 1.2 | 34.3 | 2.8 |
| **අම්පාර** | 58.4 | 1.2 | 36.1 | 4.3 | 58.3 | 3.1 | 34.8 | 3.9 |
| **ත්‍රිකුණාමලය** | 57.1 | 0.6 | 38.7 | 3.5 | 64.2 | 1.3 | 31.3 | 3.2 |
| **කුරුණෑගල** | 50.5 | 3.2 | 35.0 | 11.3 | 51.1 | 2.4 | 36.6 | 9.9 |
| **පුත්තලම** | 52.9 | 4.9 | 33.8 | 8.4 | 57.7 | 4.5 | 29.8 | 8.0 |
| **අනුරාධපුරය** | 38.3 | 1.0 | 41.4 | 19.3 | 38.3 | 1.2 | 41.6 | 18.9 |
| **පොළොන්නරුව** | 44.9 | 0.9 | 42.3 | 11.9 | 46.4 | 2.3 | 42.4 | 8.9 |
| **බදුල්ල** | 46.0 | 1.4 | 35.3 | 17.4 | 47.5 | 0.4 | 35.2 | 16.8 |
| **මොණරාගල** | 35.9 | 0.7 | 44.4 | 19.0 | 34.1 | 1.0 | 48.7 | 16.3 |
| **රත්නපුර** | 55.9 | 3.0 | 33.8 | 7.4 | 54.8 | 2.9 | 33.2 | 9.2 |
| **කෑගල්ල** | 63.1 | 1.4 | 29.6 | 5.9 | 62.9 | 3.0 | 28.9 | 5.2 |
| **එකතුව** | 57.8 | 2.7 | 31.6 | 7.8 | 57.7 | 3.0 | 31.3 | 8.0 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - වාර්ෂික වාර්තා

ඉහත දත්ත දෙස බැලීමේ දි 2016 හා 2017 වර්ෂ ගත්විට සේවක සංඛ්‍යාව කොළඹ දිස්ත්‍රික්කයේ පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වීමක් දක්නට ලැබේ. 2016/ 2017 වර්ෂ දෙකම ගත්විට සේවා යෝජකයින් වැඩි ප්‍රමාණයක් දක්නට ලැබෙන්නේ කොළඹ, පුත්තලම, හලාවත යන දිස්ත්‍රික්වල ය.

03. රැකියාවේ තත්වය අනුව සේවා නියුක්තිය ( ස්ත්‍රී/ පුරුෂභාවය අනුව) – 2016 / 2017

| රැකියාවේ ස්වභාවය | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | % | ස්ත්‍රී | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| එකතුව | 5,149,948 | 100.0 | 2,797,735 | 100.0 | 5,279,158 | 100.0 | 2,929,021 | 100.0 |
| සේවක | 3,031,580 | 57.8 | 1,563,997 | 55.9 | 3,102,053 | 58.9 | 1,631,978 | 55.7 |
| රාජ්‍ය | 639,665 | 14.6 | 517,993 | 18.5 | 650,219 | 12.4 | 528,489 | 18.0 |
| පෞද්ගලික | 2,391,914 | 43.3 | 1,046,004 | 37.4 | 2,451,835 | 46.4 | 1,103,489 | 37.7 |
| සේවා යෝජක | 190,858 | 2.7 | 26,357 | 0.9 | 216,143 | 3.7 | 31,327 | 1.1 |
| තමාගේම වැඩ කරන්නා | 1,785,888 | 31.6 | 725,861 | 25.9 | 1,822,502 | 34.7 | 748,521 | 25.6 |
| පවුලේ ආර්ථිකයට උදව් කරන්නා | 141,622 | 7.8 | 481,519 | 17.2 | 138,460 | 2.7 | 517,195 | 17.7 |

ඉහත දත්ත අනුව දක්නට ලැබෙන්නේ සේවක සංඛ්‍යාව 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ සුළු වැඩිවීමක් දක්නට ලැබෙන බවයි. සේවා යොජකයින් ගත්විට ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශ්වයේ ම යම් වර්ධනයක් දක්නට ලැබේ. ස්ත්‍රී පාර්ශ්වය ගත්විට වැඩි ප්‍රමාණයක් තමන්ගේම වැඩ කටයුතු කරන ගන්නා කාණ්ඩයට අයත් වන බව දක්නට ලැබේ. පවුලේ ආර්ථිකයට උදව් කරනු ලබන කාණ්ඩය ගත්විට පුරුෂ පාර්ශ්වය පහළ මට්ටමක දක්නට ලැබේ. මෙහි දී පෞද්ගලික හා රාජ්‍ය අංශය ගත්විට පුරුෂ පාර්ශ්වයේ 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ යම් අඩුවීමක් දක්නට ලැබේ. පෞද්ගලික අංශයේ ද වර්ධනයක් දක්නට ලැබේ. අංශ දෙකම ගත් විට කාන්තා පාර්ශ්වයේ සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබේ.

04. රැකියාවේ සේවා තත්වය ස්ත්‍රී/ පුරුෂභාවය අනුව (%) - 2017 - 2018

| රැකියාවේ ස්වභාවය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| සේවක | 65.5 | 34.5 | 66.1 | 33.9 |
| සේවා යෝජක | 87.3 | 12.7 | 88.0 | 12..0 |
| තමාගේම වැඩ කරන්නා | 70.9 | 29.1 | 73.9 | 26.1 |
| පවුලේ ආර්ථිකයට උදව් කරන්නා | 21.1 | 78.9 | 22.9 | 77.1 |

ඉහත දත්ත අනුව දක්නට ලැබෙන්නේ සේවක සංඛ්‍යාව පුරුෂ පාර්ශවයේ යම් වර්ධනයක් පෙන්නුම් කළ ද, ස්ත්‍රී පාර්ශ්වයේ යම් අඩු වීමක් දක්නට ලැබෙන බවයි. අනෙක් කාණ්ඩවලද එය දක්නට ලැබේ

05. රැකියාවේ සේවා තත්වය ස්ත්‍රී/ පුරුෂභාවය අනුව - 2018




ඉහත දත්ත සටහනට අනුව සේවා නියුක්තිය ගත්විට පුරුෂ පාර්ශ්වයේ වැඩි සහභාගීත්වයක් දක්නට ලැබේ.

නිගමන හා යෝජනා

සේවා තත්වය අනුව සේවා නියුක්තිය ගත්විට රාජ්‍ය අංශයට සාපේක්ෂව පෞද්ගලික අංශයේ ඉහළ වර්ධනයක් දැකිය හැකිය.

සේවා නියුක්තිය කෙරෙහි ස්ත්‍රී බලකායේ සහභගීත්වය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතුය.